# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1250/17 – 2002 අගෝස්තු 21 වැනි බදාදා – 2002.08.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 21/78(v).

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

**24අ (1) වගන්තිය යටතේ නියමය**

තෘතීයික අධ්‍යාපනය හා පුහුණු අමාත්‍ය කබීර් හෂීම් වන මම, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තියේ, (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්–

(1) පරිගණක විද්‍යාව, තොරතුරු හා සංනිවේදන තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය සැපයීමේ ප්‍රවර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා 2002.09.01 දින සිට බලපවත්වන පරිදි උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවමි: සහ

(2) එම මධ්‍යස්ථානයට "කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධි අධ්‍යයනායතනය" යන නාමය හා අභිධානය නියම කරමි.

කබීර් හෂීම්,
තෘතීයික අධ්‍යාපනය හා පුහුණු අමාත්‍ය.

2002 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දීය.

09-229/1.

---

එල්. ඩී. – බී. 21/73(v).

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

**27 (1) වගන්තිය යටතේ නියමය**

තෘතීයික අධ්‍යාපනය හා පුහුණු අමාත්‍ය කබීර් හෂීම් වන මම, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ, (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඒ පනතේ 24අ වගන්තිය යටතේ කරන ලදුව, 1987 සැප්තැම්බර් 14 දින හා අංක 471/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පරිගණක තාක්ෂණ ආයතනය පිහිටුවීමේ නියමය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමයෙන් 2002.09.01 දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරමි.

කබීර් හෂීම්,
තෘතීයික අධ්‍යාපනය හා පුහුණු අමාත්‍ය.

2002 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-229/2

1A – G 001811 – 1,100 (2002/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.